# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 නොවැම්බර් මස 26 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01.** ගරු සිරිකමල් පිලිෂියන්ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2013.11.05 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V (1)13/15)

අ. පමුණුගම රෝහලේ මාතෘ නිවාසය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ආ. එම රෝහලේ රසායනාගාරය අක්‍රියව පවතින බව ඔබතුමා දන්නවාද ?

ඇ. එම රෝහලේ බාහිර රෝගී අංශය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ඔබතුමා දන්නවාද ?

ඈ. රෝහල් කාර්ය මණ්ඩලය අතර ඇති අසමගිභාවය නිසා රෝගීන් සහ පරිපාලනය අපහසුතාවයට ලක් වී ඇති බව ඔබතුමා දන්නවාද ?

ඉ. මෙම තත්වය පිළබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද ?

**02.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: [ප්‍ර / V (1) 13 / 16]

අ. ඔබ අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ ත්‍රිරෝද රථ සඳහා මීටර් ලබා දුන්නේද ?

ආ. එම මීටර් වර්ගය හා නිෂ්පාදන නාමය කුමක්ද?

ඇ. එක මීටරයක මිල කීයද?

ඈ. කොපමණ මීටර් සංඛ්‍යාවක් බෙදා දුන්නේද?

ඉ. එම මීටර් සඳහා කොපමන මුදලක් වැය කලේද ?

ඊ කෘෂිකර්ම අමාත්‍යංශයේ කර්මාන්ත අධිකාරිය මගින් ලබා දුන් ත්‍රිරෝද රථ මීටර් වර්ගයට වඩා ඔබ අමාත්‍යංශය ලබාදුන් මීටර් වල ඇති වෙනස කුමක්ද?

උ. ඔබ අමාත්‍යංශය මගින් ලබාදුන් මීටර් සවිකරන ලද ත්‍රිරෝද රථ වල අලවා ප්‍රදර්ශනය කරන ස්ටිකරයේ මහරගම නගර සභාවේ සභාපතිතුමියගේ ඡායාරූප ද ඇතුලත් කර ඇත්තේ කුමන පදනමකින්ද?

03. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්ක හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

[ප්‍ර / V (1) 13

අ. ඔබතුමාගේ අමාත්‍යංශය යටතේ හා ඊට අදාල ආයතන යටතේ පසුගිය වසර පහ තුල ඔබතුමා සහභාගී වූ විදේශ සංචාර ගණන කොපමණද ?

ආ. සංචාරය කල රටවල් මොනවාද?

ඇ. කුමන කාරණා සඳහාද?

ඈ. වසර 05 ක කාලය තුල විදේශ සංචාර සඳහා ඔබ අමාත්‍යංශය හා ඊට අදාල ආයතන වියදම් කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද?

ඉ. එකී විදේශ සංචාර වල යෙදුන දින වකවානු මොනවාද?

ඊ. ඔබතුමා සමග මෙකී විදේශ සංචාර වලට සහභාගී වූ නිලධාරීන් පිළිවෙලින් කව්රුන්ද?

උ. ඔවුන් තෝරාගත් පදනම කුමක්ද?

ඌ. එකී සංචාර සඳහා වැය කල මුදල් වාර්ෂිකව වෙන වෙනම කොපමණද?

එ. මීට අමතරව මෙම කාලය තුල ඔබතුමා වෙනත් අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ විදේශ සංචාර වල නිුයැලුනේද ?

ඒ. එසේනම් ඒ දිනයන් හා රටවල් සඳහන් කරන්නේද?

04. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නී සාමය ඉඩම්. අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

[ප්‍ර / V (1) 13

අ. හෝමාගම - හංවැල්ල ශාන්ත ජෝන් බොස්කෝ විදුහල්පතිව සිටි එස්. කේ. කරුණාරත්න මහතාගේ කාලයේ සිදු වුවා යැයි කියන වංචා හා දූෂණ සම්බන්ධයෙන් විගණන වාර්තාවක් තිබේද?

ආ. මේ කාලයේ ආපනශාලාවෙන් අයවිය යුතු රු. 99,640/- ක් අයකිරීමට කටයුතු නොකලේ මන්ද? ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද ?

ඇ. වැසිකිලි 05 ක වහල ඉදිකිරීම් වෙනුවෙන් රු. 815,000/- ක බිල්පත් සඳහා අදාල ආයතනවලට චෙක්පත් මගින් ගෙවීම් නොකර, කාර්ය මංඩලයේ නමින් චෙක්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ගත් පියවර කුමක්ද?

ඈ. රුපියල් 1073260/- වටිනා වියදම් ඇස්තමේන්තු සඳහා වව්චර් පිළියෙල කිරීමෙන් තොරව විදුහල්පතිගේ නමට රු. 8,30,000/- මුදලක්ද, චාමිනි මානවඩු ගුරුතුමිය නමින් රු. 10,000/- ක්ද අයේෂ් ලක්මාල් නැමැති පාසැල් කම්කරු නමට රු. 3,510/- ක්ද සුදේශ් ගුණවර්ධන නැමැති පුස්තකාල සහායක නමින් රු. 31,500/- ක්ද වන ලෙස මුදල් ලබා ගෙන ඇති අතර, ඒ සඳහා ගත් පියවර කුමක්ද ?

ඉ. එකී කාර්ය මණ්ඩලය එම පාසැලේ සේවයේ යෙදී සිටින්නේ කෙසේද?

ඊ. කොට්ඨාශ අධ්‍යක්ෂ ආරියරත්න හා විදුහල්පති සම්බන්ධයෙන් වූ අල්ලස් හා දූෂණ චෝදනා පැමිණිල්ලට ඔබතුමා ගත් පියවර කුමක්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජ

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රක

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"2013 - 11 - 05 වන දින පැවැති පළාත් සභා රැස්වීමේදී එළඹුණු සභා සම්මුතියට අනුව 2013 දෙසැම්බර් මස 03, 04, 05 හා 06 යන දිනයන් 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් වන අතර, එම දිනවල වැඩ කටයුතු සඳහා කාරිය පටිපාටි රීති අංක 50 (5) හි සඳහන් කාල පරාසයන්හෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය".

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"2013 - 11 - 05 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ලද එකඟතාවයට අනුකූලව අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක XI ලෙස සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතුවලට පිවිසීමට පෙරාතුව විෂයය අංක XII ලෙසින් සඳහන් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු නැමැති විෂයයේ වැඩ කටයුතු නිමා කළ යුතුය"

# XI.. පොදු කටයුතු

01. **ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩ අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන ද විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා :**

2011 අංක 05 දරණ බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 32 (1) වගන්තිය යටතේ සාදනු ලබන රීති.

---

'2011 අංක 05 දරණ බස්නාහිර පළාතේ, වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 31 වගන්තිය සමග කියැවිය යුතු 32 (1) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්. අධ්‍යාපන, පළාත්පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන හා විදුලිබල හා බලශක්ති සහ වෙළඳ විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1829 / 32 හා 2013-09-25 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රීතීන්

එනම් ;

i. ව්‍යාපාර නාමයන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා අයකළ යුතු ගාස්තු පැනවීම
ii. ව්‍යාපාර නාම සහතිකයක් නිකුත් කිරීම හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා භාවිතා කල යුතු ආකෘති පත්‍ර හඳුන්වා දීම හා
iii. ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම, වෙනස්කමක් සිදුකිරීම, හෝ අවලංගු කිරීම යන අවස්ථාවලදී ලබා ගත යුතු ලියවිලි නියම කිරීම

යන කරුණු සම්බන්ධයෙන් වූ රීතින් ඉහත කී ප්‍රඥප්තියේම 32 (3) වගන්තියේ විධි විධාන ප්‍රකාරව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි.'

02. **ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :**

"*2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය*"

(මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම)

03. **ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාවිසින් ඉදිරිපත් කරනු ලැබීමට**

"*2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය*"

(විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම)

## XII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු නෙළුක් දර්ශන මල්ලව මන්ත්‍රීතුමා :**

'රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුල සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුලත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුලත් වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වන විට රජය තිරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා/පෙළ) පරීක්ෂණය විෂයන් 06 සමත් වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙය රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% පමණ සෘජු ලෙසම බලපාන තීන්දුවකි. මන්දයත් සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂය අසමත් වන කණ්ඩායම 50% ආසන්නය. එයින් ගම්‍යවන එක් දෙයක් වන්නේ රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැති වීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටියි.'

(යෝ/V(01)13/10)

2013 - 10 - 22 හා 2013 - 11 - 05
යන දිනවල පැවැති සභා රැස්වීම්හී
වැඩකටයුතු හා සම්බන්ධිතයි

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.11.05 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.